රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2014

මගේ අංකය: EST-7/OFTIM/07/1011
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.03.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාවන්

රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් නිකුත් කළ 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2006 වෙත ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයෙන් නියම කර ඇති රජයේ නිලධරයන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් පහත සහනය ලබා දීමට 2013.11.11 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

02. අදාළ නිලධරයන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් බාධාවකින් තොරව කරගෙන යා හැකි බවට සහ වෙනත් ආකාරයකින් කාර්යාල වේලාවන් නියම කර නොමැති බවට ආයතන ප්‍රධානියා විසින් තහවුරු කිරීමට යටත්ව, පහත සඳහන් පරිදි කටයුතු කළ හැකිය.

(අ) පෙ.ව. 8.30 ට සේවයට වාර්තා කළ යුතු නිලධරයන් පෙ.ව. 8.15 ට හෝ ඊට පෙර සේවයට වාර්තා කළහොත් එම නිලධරයන්ට එදින කාර්යාල වේලාවෙන් පසුව රාජකාරී අවශ්‍යතාව මත ඉටු කළ යුතු කාර්යයන් නොමැති අවස්ථාවල දී පමණක් ප.ව. 4.00 ට කාර්යාලයෙන් බැහැර වීමට අවසර ලබා දීම.

(ආ) ප්‍රාථමික ශ්‍රේණියට අයත් නිලධරයන්ට 1980.04.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 162න් ලබා දී ඇති සහනය තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

03. ඉහත (අ) සහ (ආ) හි සඳහන් සහන එම නිලධරයන් කාර්යාලයේ ගත කරන කාලය තුළ නියමිත රාජකාරි ඉටු කරන බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් ලබා දිය යුතුය.

04. ඉහත 02(අ) හි සඳහන් සහන, නිල වාහන හිමි තනතුරක් දරන/ එවැනි තනතුරක වැඩ බලන/ රාජකාරී ඉටුකරන/ ප්‍රවාහන පහසුකම් සලසා දී ඇති සහ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දී ඇති නිලධරයන් සඳහා අදාළ නොකර ගත යුතුය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය